**2026 මාර්තු මාසයට අදාලව 2026.03.10 වන දින පවත්වන ලද**
**බිබිල ප්‍රාදේශීය සභාවේ විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව.**

**දිනය** - 2026.03.10
**වේලාව** - ප.ව.2.00
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

සහභාගීත්වය -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 06. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12.ඩබ්.එස්.එම්.වසන්ත් ප්‍රියදර්ශනී සමරකෝන් | - | ගරු මන්ත්‍රී |
| 13. එල්.ඒ.බී. චින්තිකා හර්ශනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 14. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණ කුලසූරිය | - | ගරු මන්ත්‍රී |

**බිබිල බස්නැවතුම්පොළ දකුණු පස කඩකාමර සම්බන්ධ අංක 59784, 59785, 59786, 59787, 59788, 59789, 60643, 60644, 61051 නඩු සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ තීරණය ලබා දීම.**

බිබිල බස් නැවතුම්පොල දකුණු පස ඉදිකර ඇති කඩ කාමර අනුමත ගොඩනැගිලි සැලැස්මට අනුකූල නොවන අයුරින් ඉදිකිරීම හේතුවෙන් අනවසර ඉදිකිරීමක් බවට බිබිල ප්‍රාදේශීය සභාව විසින් බිබිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී.

එම නඩුවට අදාල නඩු විභාගය අවසන් වරට කැඳවන ලද්දේ 2025.11.06 වැනි දිනය. එහිදී ගරු මහේස්ත්‍රාත් තුමා විසින් දන්වන ලද්දේ මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ තීරණය ඊළඟ නඩුව කැඳවන 2026.03.19 වන දිනයේදී දන්වන ලෙසයි.

එදිනට ගරු අධිකරණයට බිබිල ප්‍රාදේශීය සභාවේ තීරණය හෝ එකඟතාවය කුමක්ද යන්න ඉදිරිපත් කළ යුතු බැවින් ඒ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා</u>**

බිබිල බස් නැවතුම්පොල දකුණුපස කඩකාමර බිබිල ප්‍රාදේශීය සභාවේ අනුමත ගොඩනැගිලි සැලැස්මට අනුමත නොවන ආකාරයට ඉදිකර ඇති බවත් එම ගොඩනැගිල්ලෙහි ඇති කඩ කාමර වලින් බිබිල ප්‍රාදේශීය සභාවට වරිපනම් බදු, ව්‍යාපාරික බදු, කඩකුලී ආදී කිසිදු ගෙවීමක් සිදු නොකරමින් පවත්වාගෙන යන බවත් නමුත් මෙම කඩ කාමර වල අපවිත්‍ර ද්‍රව්‍ය ඉවත් කිරීම, පවිත්‍ර කිරීම්, වීථි ලාම්පු මගින් ආලෝකය ලබා දෙමින් නඩත්තු කටයුතු සිදු කරන බව පැවසීය. මෙම කඩ කාමර පළාත් සභා අරමුදලෙහි ප්‍රතිපාදන මගින් අත්තිවාරම බිබිල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය මගින් ඉදිකර ඇත.

එවකට පැවති දේශපාලන අධිකාරිය හා ව්‍යාපාරික මහතුන් අතර ඇතිවූ ගැටුම්කාරී තත්වය නිසා මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම නතර කර ඇත. පසුව මේවාට හිමිකම්පත්‍ර හිමිවූ බව පවසමින් ව්‍යාපාරික මහතුන් මෙම කඩවල ඉතිරි වැඩ අනුමත ගොඩනැගිලි සැලැස්මට අනුකූල නොවන අයුරින් තම පෞද්ගලික වියදමින් ඉදිකර ගෙන ඇති බව පැවසීය.

එබැවින් මේ සම්බන්ධයෙන් බිබිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත් 2026.03.19 වන දින ඊළඟ නඩු වාරය බැවින් එම කඩ කාමර සම්බන්ධයෙන් සභාවේ තීරණයක් ලබා දෙන ලෙස ගරු නඩුකාරතුමන් විසින් දන්වා ඇති බැවින් ඒ පිළිබඳ තීරණයක් ලබා ගැනීමට අද දින විශේෂ මහ සභාවක් කැඳවීමේ අරමුණ බව පැහැදිලි කරන ලදී. ප්‍රාදේශීය සභාව සඳහා සභිකයින් ලෙස පත් වී ඇත්තේ ප්‍රදේශයේ ජනතාවගේ පොදු සුභ සාධනය ,පොදු ක්‍රියාකාරිත්වය, පොදු සාමාජීය කටයුතු සඳහා සහනයක් , අත්වැලක් ලබා දීමේ අරමුණින් සහ ජන ජීවිත නගා සිටුවීමට බැවින් නඩු සඳහා සභාවේ අරමුදල් වැය නොකර මේ ව්‍යාපාරික මහතුන් සමඟ පොදු එකඟතාවයකට පැමිණෙන්නේ නම් සුදුසු බවද පැවසූ අතර මන්ත්‍රී මණ්ඩලය නොදන්නා කරුණු ව්‍යාපාරික මහතුන්ගෙන් ලබාගැනීමට හැකි බැවින් මෙම කඩහිමි ව්‍යාපාරික මහතුන්ට හා ආදායම් පරීක්ෂක මහතාටද අද දින සභාවේ ගැලරියට පැමිණීමට ආරාධනා කළ බවත් පැවසීය. සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලයට නිදහස් අදහස් ප්‍රකාශ කිරීම සඳහා කාරක සභා අවස්ථාවෙන් පසු ව්‍යාපාරික මහතුන් ගැලරියෙන් ඉවත්ව යන ලෙස කාරුණික ඉල්ලීමක් ද සිදු කරන ලදී.

මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>**

මෙම කඩ කාමර සම්බන්ධයෙන් අවසාන නඩු වාරය 2025.11.05 දින බවත් ඊළඟ නඩු වාරය 2026.03.19 දින බවත් පමණක් දැනුවත් බැවින් අනෙකුත් තොරතුරු තමා නොදන්නා බවත් එබැවින් මෙම කඩ කාමර සඳහා මුලින්ම නඩුව ගොනු කළ දිනය , මෙම කඩ කාමර 11ට අමතරව තවත් කඩ කාමර මෙම ස්ථානයේ තිබේද? , මෙම කඩ කාමරවල හිමිකරුවන් කවුද?, අතුරු බදුකරුවන් සිටීද?, පහත මහලේ හා උඩු මහලේ කඩ කාමර දෙකට එකම ව්‍යාපාරික මහතාට හිමි ද? යන්න පිළිබඳවත් , ගොඩනැගිල්ලේ ඉදිකිරීම ප්‍රමිතියට අනුකූල නොවන බව ආදායම් පරීක්ෂක මහතා දන්වා ඇති බැවින් මෙම ගොඩනැගිල්ල පිළිබඳව කාර්මික නිළධාරි පරීක්ෂණයක් සිදු කළේ ද?, එසේ නම් ප්‍රමිතියට අනුකූල නොවන්නේද ?, ඒ කුමන නිර්නායක මතද ?, යන්න පිළිබඳව කරුණු දැක්වීමට කාරක සභා අවස්ථාවේ නිළධාරි මණ්ඩලය කැඳවන ලෙස ඉල්ලා සිටින ලදී.

ප.ව.2.20ට ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ප.ව. 2.30 ට ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකොන් මැතිතුමිය සභා ගර්භයට පැමිණෙන ලදී.

ප.ව. 2.33 ට ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.

ප.ව. 2.44 ට ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා හා ගරු එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය සභා ගර්භයට පැමිණෙන ලදී.

ප.ව. 3.30 ට ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාවෙහි මූල්‍යමය ශක්තිය අඩු බැවින් මෙම කඩ හිමි ව්‍යාපාරික මහතුන්ට වඩා එම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට බිබිල ප්‍රාදේශීය සභාවට අපහසු බව පැවසූ අතර පළාත් පාලන කොමසාරිස්තුමා ගෙන් හා වෙනත් උපදෙස් ලබා ගත හැකි ආයතන වලින් උපදෙස් ලබා ගෙන මෙම ව්‍යාපාරිකයින් සමඟ නිවැරදි ගිවිසුමකට එළඹීම සුදුසු බව පැවසීය. මෙම ගොඩනැගිල්ලෙහි උඩු මහලෙහි ප්‍රමිතිය පිළිබඳව කාර්මික නිළධාරි මහතෙකු මගින් වාර්තාවත් ලබා ගැනීමටත් සැලැස්මට අනුකූල නොවන ආකාරයට ඉදිකර ඇති තරප්පු පෙළ නිවැරදිව ඉදිකිරීම් කිරීමට හා උඩු මහල නිවැරදිව ඉදිකිරීම් කිරීමටත් සුදුසු බව පැවසීය.

ව්‍යාපාරිකයින් ගැලරියෙහි සිටින අවස්ථාවේ දී අදහස් දැක්වූ ආකාරයටම ඒ අය ගැලරියෙන් ඉවත්ව ගිය පසුද අදහස් දැක්විය යුතු බවත් එසේ නොවන විට එය ගැටලු සහගත බවත් පැවසීය.

මෙය පැවති දේශපාලනයන්හි දූෂණ ක්‍රියා නම් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කර දූෂිතයන්ට දඩුවම් ලබා දීමට කටයුතු කරන ලෙස පැවසීය. යම්කිසි ආණ්ඩුවකින් නගරය සංවර්ධනය කරන්නේ නම් එම ව්‍යාපාරික හිමිකරුවන්ට වන්දි ලබාදී සංවර්ධන කටයුතු සිදුකළ හැකි බවත් ඊට උදාහරණ ලෙස බිබිල සතොස ගොඩනැගිල්ල , මත්තල ගුවන් තොටුපොල, අධිවේගී මාර්ග ඉදිකිරීමේදී ඉඩම් අයිතිකරුවන්ට වන්දි ලබා දී සංවර්ධන කටයුතු කළ බව පැවසීය.

මෙම කරුණු පිළිබඳව මෙතෙක් සාකච්ඡා කරමින් නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කරන්නේ නම් පුස්සක් බවත් මෙම කඩ හිමියන් සමග එකඟතාවයකට පැමිණ එම කඩ කාමරවල ඇතුළතින් ඇති තරප්පු පෙළවල් ඉවත් කර කඩ දෙකක් බවට පත් කර පිවිසුම් මාර්ග ඉදිකර නිවැරදි ගිවිසුමකට එළඹෙන්නේ නම් ඉතා හොඳ බවත් නීතියේ රාමුව තුළ සභාවට ශක්තිය අඩු බවත් එබැවින් කඩ හිමියන් සමග එකඟතාවයකට පැමිණ ගිවිසුම්ගතවී කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

බස් නැවතුම්පොළ දකුණු පස කඩ කාමර ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවබෝධයක් අද දින ලැබුණු බව පැවසූ අතර පැවති දේශපාලන අධිකාරිය විසින් නිළධාරීන් වෙත වගකීම් භාරදී ගොඩනැගිල්ල ඉදිකර ඇති බවත් මේ පිළිබඳව අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළහොත් නිළධාරින් ඒ සඳහා වගකිවයුතු වන බවත් වැරදි සිදු කළ දේශපාලන අධිකාරිය ඉන් නිදහස් වන බවත් පැවසීය. මෙහි කඩ කාමර උඩු මහල හා පහත මහල ලෙස කඩ කාමර 22ක් තිබෙන බවත් මෙම කඩ කාමර 22 සඳහා කඩ හිමියන් 09ක් හිමිකම් කියන බවත් පැවසූ අතර මෙම කඩ 22 සඳහා ම ගිවිසුම් 22ක් ලෙස ගිවිසුම්ගත වියයුතු බවත් ඒ අයගෙන් සාධාරණ මුදලක් සභාවට අයකර ගැනීමට කටයුතු කළයුතු බවත් පැවසීය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා**

බිබිල ප්‍රාදේශීය සභාව විසින් මෙම කඩ කාමර සඳහා නඩු පවරා ඇත්තේ අනවසර ඉදිකිරීමක් බැවින් ඒ සඳහා කරුණු ඉදිරිපත් කළ යුත්තේ ද අනවසර ඉදිකිරීමක් ලෙසයි. එම නඩුවේදී බිබිල ප්‍රාදේශීය සභාවට අවාසියක් සිදුවන බව පෙනී යන බවත් එබැවින් ව්‍යාපාරික මහතුන් බිබිල ප්‍රාදේශීය සභාවට කඩ කාමර පවරා දී බදුකුලී ගෙවමින් පවත්වාගෙන යාමට කැමති නම් එම ක්‍රියා මාර්ගයට යාමට සුදුසු බව පැවසීය. එක් පුද්ගලයෙකුට කඩ කාමර 2ක හිමිකම් තිබේ නම් එම කඩ දෙකම එක පුද්ගලයෙකුට දෙනවාද යන්න ප්‍රශ්නයක් බව පැවසීය. එක් පුද්ගලයෙකුට කඩ කාමර 2ක් ලබා දුනහොත් පුද්ගලයින්ට ව්‍යාපාරික අවස්ථාවන් නොලැබී යන බවත් මෙහි තිබෙන පිවිසුම් මාර්ග තරප්පු පෙළවල් ව්‍යාපාරිකයින්ට පාරිභෝගිකයින්ට ආකර්ෂණය නොවන ආකාරයෙන් සකස් කර ඇති බැවින් මෙම ගොඩනැගිල්ලෙහි තරප්පු පෙළවල් නිවැරදි ආකාරයෙන් ඉදිවිය යුතු බව පැවසීය.

**ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා**

මෙම ගොඩනැගිල්ලෙහි එක් ව්‍යාපාරික මහතෙකුට කඩ කාමර 2ක් නොව පොළොව යට තිබෙන කඩ කාමරය සමග කඩ කාමර 3ක් තිබෙන බව පැවසීය. සතිපොළෙ කුඩා ව්‍යාපාර කරනු ලබන ව්‍යාපාරිකයින්ගෙන්ද බිබිල ප්‍රාදේශීය සභාවට කුලී මුදලක් අයකරන බවත් මෙම බිබිල නගර මධ්‍යයේ තිබෙන ව්‍යාපාරික මරමස්ථානයක් වූ මෙම කඩ කාමර වලින් සුදුසු මුදලක් තක්සේරු කර අය කළයුතු බවත් නිවැරදි ලෙස ගිවිසුම් ගතව මෙම කඩ හිමියන්ටම ලබා දීමට තමාද විරෝධතාවයක් නොමැති බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකොන් මැතිතුමිය**

බිබිල බස් නැවතුම්පොල දකුණුපස කඩ කාමර 11ක් අනුකූලතාවයෙන් තොරව ඉදිකර ඇති බව සිතා සිටි බවත් අද දිනයේ දී මෙම එක් කඩ හිමියෙකුට කඩකාමර 3ක් හිමිව ඇතිබව දැනගත් බව පැවසීය. එක් පුද්ගලයෙකුට නගර මධ්‍යයේ කඩ කාමර 3ක් ලබාදීම අසාධාරණ බවත් එසේ ලබාදුනහොත් තවත් පුද්ගලයෙකුට ලැබෙන ව්‍යාපාරික අවස්ථාවක් ගිලිහී යන බව පැවසීය. අවුරුදු 14ක් තිස්සේ සභාවට කිසිදු මුදලක් ලබා නොදී ව්‍යාපාර කරමින් මුදල් උත්පාදනය කරගෙන ඇති බවත් එබැවින් කඩ කාමර ප්‍රාදේශීය සභාවට පවරා ගෙන මෙම ව්‍යාපාරිකයින්ට පහත මාලයේ කඩ කාමර පමණක් කුලී පදනම මත ලබාදී උඩු මහලේ කඩ කාමර ටෙන්ඩර් කිරීමට සුදුසු බව සිතන බවත් එසේත් නැතිනම් නැවතත් ව්‍යාපාරිකයින් සමග සාකච්ඡා කර හෝ නිවැරදිව ගිවිසුමක් සකස් කර ඒ අනුව ගිවිසුම්ගතවීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා**

ව්‍යාපාරික මහතුන් විසින් මෙම කඩ කාමර සම්බන්ධයෙන් හිමිකම් සහතික, අනුකූලතා සහතික තිබෙන බව පැවසුවද දේශපාලන පසුබිම මත මේවා ඉදිකර ඇති බව පෙනී යන බවත් මෙම කඩ හිමියන්ගේ නාම ලේඛනය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

1. වොඩ්සන් අලවත්ත මයා
2. එල්.එච්.ට්‍රිලන්ත මයා
3. එච්. එම්. මන්ජුල මයා
4. ටී.එම්.එන්.එස් ජයවර්ධන මයා
5. ඊ.කේ. ආරච්චි මයා
6. වයි.එම්.ශාන්ත මයා
7. එච්.එම්. කරුණාතිලක මයා
8. ඒ.එම්.රසික විජේසිරි මයා

වොඩ්සන් අලවත්ත මහතාට හා එච්.එම්.කරුණාතිලක මහතාට යන ව්‍යාපාරික මහතුන් සඳහා කඩකාමර දෙක බැගින් හිමිකමක් ඇති බව පැවසීය.

මෙම කඩ හිමියන් කඩ කාමර බිබිල ප්‍රාදේශීය සභාවට පවරා නොදුනහොත් ඉදිරියේ දී සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මේවා ඉවත් කිරීමට සිදුවුවහොත් ඉවත් කිරීමට රජයක් සඳහා විශාල මුදලක් වැයවන බව පැවසීය. මෙම කඩ කාමර අනිවාර්යෙන්ම පවරාගෙන සභාවට අයිතිය ලබාගතයුතු බවත් මේවා පවරා ගැනීමට පෙර එම ව්‍යාපාරිකයින්ගෙන්ම අනුකූල නොවන ලෙස සිදු කර ඇති ඉදිකිරීම් ඉදිකරවාගෙන ම පවරා ගතයුතු බවත් නඩු තීන්දුව කඩා ඉවත් කිරීම නම් ඒ අය ලවාම කඩා ඉවත් කරවන ආකාරයට තීන්දු ලබා ගැනීමට කටයුතු කළයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>

බිබිල බස් නැවතුම්පොළ දකුණු පස කඩ කාමර සම්බන්ධයෙන් මෙවැනි නඩු මගකට යාමට සිදුවූයේ දේශපාලන අධිකාරියේ හා නිළධාරීන්ගේ නොමනා ක්‍රියා නිසා බව පැවසීය. සෑම කඩයකම උඩු මහලට තරප්පු පෙලක් ඉදිකර තිබීම තුළින් පෙනී යන්නේ මෙය අනුකූල නොවන ආකාරයටම හිතුමතේ ඉදිකර ඇති බවක්ය. මෙහි යට ඇති කාණුව තුළ යම් යම් නොමනා ක්‍රියා සිදුවන බවද පැවසීය. පැරණි දේශපාලඥයින්ගේ හා නිළධාරීන්ගේ ක්‍රියා නිසා මෙම කඩ හිමියන් වරප්‍රසාදයන් භුක්ති විඳින ගමන් ඒ අයට කිසිදු අගය කිරීමක් නොකරමින් වැරදි පැවසීමට තරම් ගුණමකු වීම මගින් පෙනී යන්නේ මෙම ගරු සභාවේදීද මන්ත්‍රී මණ්ඩලය ගනු ලබන තීරණයන්ටද ඉදිරියේදී විරෝධතාවය එල්ල කිරීමට හැකි බවත් එබැවින් මේ පිළිබඳ තීරණයක් ගැනීමට නම් සම්පූර්ණ අධ්‍යනයක් සිදුකර කරුණු අවබෝධ කරගතයුතු බවයි. මෙම ඉදිකිරීම සිදුකර ඇති භූමිය විටෙක ප්‍රාදේශීය ලේකම් සතු බවත් වරෙක මගී ප්‍රවාහන අධිකාරිය සතු බවත් පවසන බැවින් මෙහි නිවැරදි අයිතිය කාගේද යන්න තහවුරු කරගතයුතු බවත්, සභාපතිතුමා පවසන ආකාරයට එම ව්‍යාපාරිකයින් සමග නිවැරදිව ගිවිසුම්ගතව සභාවට ආදායම් උත්පාදනය කිරීමට එකඟවන බවද පැවසීය.

<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>

මෙම කඩ කාමර දේශපාලන අධිකාරියේ බලය මත ඉදිකර ඇති බවත් මෙම කඩ කාමරවල මුලු අයිතිකරුවන් මේ වනවිට මෙම කඩ කාමර විකුණා එම කඩ කාමර වල හිමිකාරීත්වය වෙනත් අය වෙතට ලැබී ඇති බවත් පැවසීය. මෙම නඩුවෙහි ජයග්‍රහණය ව්‍යාපාරිකයින්ට හිමිවේද ප්‍රාදේශීය සභාවට හිමිවේද යන්න තීරණය කළ නොහැකි බවත් මේ අයට බිබිල නගර මධ්‍යයේ කඩ කාමරයක් හිමිවීම විශාල ආදායම් මාර්ගයක් බවත් මේවා ඉදිකිරීම සඳහා විශාල මුදලක් ඒ අයට වැය වන්නට ඇතැයිද නමුත් මේ වනවිට එම වියදම් වූ මුදල් උත්පාදනය කර ගැනීමට හැකිව ඇතැයිද පැවසීය. මෙම කඩ කාමර සම්බන්ධයෙන් නෛතික රාමුව තුළ පළාත් පාලන කොමසාරිස්තුමාද නඩු තීන්දුව අනුව කටයුතු කරන ලෙස දන්වා ඇති බැවින් ඒ පිළිබඳව තොරතුරු සියල්ල අධ්‍යනය කළයුතු බවත් එබැවින් මෙම නඩුව ඉදිරියට කල් තබාගෙන සියලු දෙනා එක්ව නිවැරදි තීරණයක් ගතයුතු බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය</u>

අතීතයේ මෙම කඩ තිබෙන තැන විශාල කාණුවක් තිබුණු බවත් මෙහි කඩ කාමරයක් තමාගේ ඥාතියෙකු ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන ගිය බැවින් මෙම ස්ථානයෙන් විශාල ආදායමක් උත්පාදනය කළහැකි බව තමා අවබෝධ කරගෙන ඇති බවත් මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති භූමියෙහි හිමිකාරීත්වය ප්‍රාදේශීය ලේකම්තුමාගේද මගී ප්‍රවාහන අධිකාරියේ ද යන්න පිළිබඳව නිරාකරණය කරගෙන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ව්‍යාපාරිකයින්ටද අසාධාරණයක් නොවන ආකාරයේ තීරණයක් ගැනීම සුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය ප.ව. 4.15 ට සභා ගර්භයෙන් පිටව ගියාය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

අතීතයේ ජනතාව දැඩි ආකල්ප වලට නතුවී බලෙන් අත්පත් කරගෙන අන් අයට හිමිවීමට තිබූ දේවල්ද තමාට අයිති කරගෙන කටයුතු කළද මේ වනවිට ඒ අයගේ ආකල්ප පිරිසිදුව හොඳ තත්වයට පත් වෙමින් තිබෙන බව මෙම කරුණ තුළින් අවබෝධ වන බව පැවසීය. මෙම කඩ කාමර සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු අධ්‍යනය කර ව්‍යාපාරිකයින් සමග සාකච්ඡා කර එක් කඩ කාමරයක් බැගින් මෙම කඩ හිමියන්ට බදු ලබාදී අනෙක් කඩ කාමර තවත් අයෙකුට ව්‍යාපාරික අවස්ථාවක් ලබාදීමට කටයුතු කිරීමටත් මෙය දිගු කාලීනව කල් නොයවා සභාවේ අරමුදල් නඩු සඳහා වැය නොකරමින් ව්‍යාපාරිකයින් සමග කොන්දේසි සහිතව ගිවිසුම් ගෙන ඉක්මණින් නිවැරදි තීරණයක් ගැනීමට කටයුතු කරමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය.</u>

මන්ත්‍රී මණ්ඩලයේ අදහස් පසුව පවසනවාට වඩා කාරක සභා අවස්ථාවේ දී එම කඩහිමි ව්‍යාපාරිකයින් සිටි අවස්ථාවේදීම ඒ අය දැනුවත් වන ආකාරයට පැවසුවේ නම් නිවැරදි බව පැවසූ අතර මෙම නඩුව අවසානයට 2025.11.06 දින පැවැත්වූයේ නම් ඉදිරි නඩු වාරය 2026.03.19 දින පැවැත්වෙන්නේ නම් මෙතරම් කාලයක් මේ පිළිබඳව තීරණයක් ගැනීමට සභාවට ඉදිරිපත් නොකිරීම හා මන්ත්‍රී මණ්ඩලය දැනුවත් නොකිරීම සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක මහතා වෙත දෝෂාරෝපණයක් එල්ල කරමින් මේ පිළිබඳව තීරණයක් ගැනීමට පෙර මෙම කඩ ඉදිකිරීම පිළිබඳව අධ්‍යනය කර කරුණු අවබෝධ කර ගතයුතු බව පැවසීය.

මෙම නඩුව සහා ලේකම්තුමිය පවරා ඇත්තේ මෙම කඩ ඉදිකිරීම පිළිබඳව අධ්‍යනය කර නීතිමය රාමුව හඳුනාගෙන ඉහළ නිළධාරීන්ගෙන් උපදෙස් ලබාගෙන අනුමත කර ඇති ගොඩනැගිලි සැලැස්මට අනුකූල නොවන ආකාරයට ඉදිකිරීම සම්බන්ධයෙන් බැවින් ප්‍රාදේශීය සභාව ලෙස මෙම ව්‍යාපාරිකයින්ට පරාද නොවී නීත්‍යානුකූල භාවය වැරදි නිවැරදි භාවය අවබෝධ කරගෙන සාධාරණය ඉටු කිරීම සඳහා පත්ව සිටින මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා එක්ව නිවැරදි තීරණයක් ගතයුතු බව පැවසීය.

මෙම කඩ හිමි ව්‍යාපාරිකයින් කඩ 03 බැගින් හිමි කර ගෙන අහිංසක ජනතාවගේ බදු මුදල් වලින් , බිබිල ප්‍රාදේශීය සභාවේ අරමුදල් වලින් අයුතු ලෙස වසර ගණනාවක් භුක්ති විඳිමින් කිසිදු ගෙවීමක් සභාවට නොගෙවමින් අසාධාරණ ලෙස මුදල් උත්පාදනය කර ඇති බැවින් අසාධාරණය වෙනුවෙන් සාධාරණය ඉටු කිරීමට පත්වූ මෙම මන්ත්‍රී මණ්ඩලය අසාධාරණ පක්ෂයේ සිට ගැනීම නොකළ යුතු බවත් සමස්ථ ජනතාවගේ සර්ව සාධාරණය ඉටු කිරීම සඳහා මේ පිළිබඳව අධ්‍යනය කළයුතු බව පැවසීය. ප්‍රාදේශීය සභාව විසින් අනවසර ඉදිකිරීමක් ලෙස නඩුව ගොනු කර ඇති බැවින් ප්‍රාදේශීය සභාව නඩුව ජයග්‍රහණය ලබාගත යුතු බවත් එම ව්‍යාපාරිකයින් මෙම ස්ථානයට පැමිණියේ තමන්ට යහපතක් කර ගැනීමට මිස සමස්ථ සමාජයට යහපතක් කිරීමට නොවන බව පැවසීය. එබැවින් ප්‍රාණවත් බවේ සංකේතය අපේ ප්‍රාදේශීය සභාවෙන් පෙන්වීම සඳහා දිරිය වෙමු, හොඳ හිත දිනා ගමු, දෙපයින් නැගී සිටිමු යැයි පවසා ඉදිරියට සාකච්ඡා කර තීරණයක් ගනිමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා</u>

බිබිල නගරයේ ව්‍යාපාරික මරමස්ථානයක් වූ මෙම කඩ කාමර අවුරුදු 16ක් තිස්සේ සභාවට කිසිදු කුලියක් ලබා නොදී භුක්ති විඳින බවත් මෙම කඩ සම්බන්ධයෙන් සභාවක් ලෙස ගනු ලබන තීරණය ඉතා වැදගත් වන බවත් පැවසීය. මෙම ගොඩනැගිල්ලෙහි පොළොව යටට වන කොටසෙහි ද කඩ කාමර කිහිපයක් ඉදිකර ගෙන ඇති බව තමාද දැනුවත් බවත් පැවසූ අතර මෙම කඩ කාමර හිමි නම් ලැයිස්තුව දෙස බලන විට මෙම කඩ කාමරවල කඩ හිමියන් විසින්ම ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන්නේ කඩ හිමියන් දෙදෙනෙකු පමණක් බවත් අනෙක් කඩ සියල්ල අතුරු බදු ලබාදී ඇති බවත්ය.

මෙම ගොඩනැගිල්ලෙහි අත්තිවාරම බිබිල ගොඩනැගිලි ඉංජිනේරු කාර්යාලය මගින් ඉදිකළද තමාට හිමි කඩ බැවින් තමන් පෞද්ගලිකව ඉදිකර ගත් නිසා ශක්තිමත්ව ඉදිකළ බව පැවසුවද ඒ පිළිබඳව ද

අවධානය යොමුකළ යුතු බවත් සහා ලේකම්තුමිය විසින් ගොනු කර ඇති මෙම නඩුව මාර්තු 19 වන පැවැත්වෙන බව පවසා තීරණයක් ගැනීමට ඉදිරිපත් කළද කෙටි කාලයක් තුළ මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නොහැකි බවත් මේ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගෙන තීරණයක් ලබා ගතයුතු බවත් පැවසීය. මෙම ගොඩනැගිල්ලෙහි දකුණුපස පිවිසුම් මාර්ගය පාරිභෝගිකයෙකුට වත් නොපෙනෙන ලෙස ඉදිකර ඇති අතර එම ඉදිකිරීම් නිවැරදි වියයුතු බවත් මෙම අවස්ථාවට සහභාගිව ඇත්තේ කඩහිමියන් තිදෙනෙකු බැවින් අනෙකුත් කඩ හිමියන් සභාවේ ගිවිසුම්ගතවීම සම්බන්ධයෙන් කැමති වේද නොවේද යන්න නිශ්චිත නොවන බවත් එබැවින් මෙම නඩුවාරය ඉදිරියට කල් යවා තීරණයක් ගැනීම සුදුසු බව පැවසීය.

<u>**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**</u>

බිබිල ප්‍රාදේශීය සභාව මගින් බිබිල බස් නැවතුම්පොළ දකුණුපස කඩ කාමර සම්බන්ධයෙන් අධිකරණයට තීරණයක් ලබාදීමට පළාත් පාලන කොමසාරිස් තුමාගෙන් උපදෙස් පතා ඇති අතර ඒ සඳහා පිළිතුරු ලිපිය මගින් ගරු අධිකරණයේ තීන්දුව අනුව කටයුතු කරන ලෙස දන්වා ඇති බව පැවසීය.

මෙම කඩ කාමර සම්බන්ධයෙන් නඩුව ඉදිරියට පවත්වා ගෙන යනවාද ? එසේත් නැතිනම් සමතයකට පත්වෙනවාද ? එසේ නම් ඒ කොහොමද ? යන්න මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා අදහස් දැක්වීමේදී මේ පිළිබඳව තීරණයක් ගැනීමට ගැඹුරින් අධ්‍යානය කර තොරතුරු අවබෝධ කරගත යුතුබව පැවසීය. මෙහි අවසාන තීරණය ගරු අධිකරණය විසින් තීන්දුව ලබාගත් පසු ජයග්‍රහණය ලබන කණ්ඩායමට නැවත අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කළහැකි බව පැවසීය. මෙම නඩුවේදී ව්‍යාපාරිකයින්ගේ පෞද්ගලික තොරතුරු සෙවීම අවශ්‍ය නොවන අතර පොදු මහත් ජනතාවගේ පොදු උවමනාවන් ඉටු කිරීම වෙනුවෙන් ජනතා නියෝජිතයින් පත්වී ඇති බැවින් ඒ අරමුණේ සිට කටයුතු කළයුතු බව පැවසීය. බොහෝ දුරට රජයට වාසි සහගත තීන්දු නඩු කටයුතුවලදී ලැබුණද නඩු කටයුතු ඉතා දිගුකාලීනව පවත්වාගෙන යාමට සිදුවන බවත් ඒ සඳහා විශාල මුදලක් වැයවන බවත් පැවසූ අතර ඒ පිළිබඳව අත්දැකීම් තිබෙන බැවින් මාගේ පෞද්ගලික මතය සමතයකට පත්වීම බව පැවසීය. මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයක්ම තීරණයක් ගැනීමට කාලයක් ඉල්ලා සිටි බවත් කෙසේ වුවත් මෙම කාරණාවේදී නීතිමය ගැටලු කිහිපයක් පවතින බවත් පැවසීය. ඒවා නම් මෙම ඉඩමෙහි හිමි අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට නොව මගී ප්‍රවාහන අධිකාරියට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වීමත් නඩු කටයුත්තක් තිබෙන අවස්ථාවකදී බිබිල ප්‍රාදේශීය සභාවට මෙම ඉඩම පවරා දීමේ කටයුතු ඉඩමේ අයිතිකරු සිදු නොකරන බවත් හා නීතියෙන් ඒ සඳහා අවසරද නොමැති බවයි.

මෙම ගොඩනැගිල්ල සංවර්ධන බලපත්‍රයක් නොමැතිව සභාවේ අනුකූලතාවය නොමැතිව ඉදිකර ඇති බැවින් එහි ඉදිකිරීමෙහි ශක්තිමත්භාවය පිළිබඳ විශ්වාසයක් නොමැති නිසා කිසියම් පුද්ගලයකුට හානියක් සිදුවුවහොත් වගකීම දරා ගැනීමට සිදුවන නිසාත් , ව්‍යාපාරික මරමස්ථානයක් වූ මෙම කඩ කාමරවලින් සභාව සඳහා කිසිදු අදායමක් නොලැබෙන නිසාත් සභාව මගින් මෙම ව්‍යාපාරික ස්ථානවල කුණු කසල ඉවත් කරමින් පවිත්‍ර කරමින් වීථි පහන් ආලෝකය ලබා දෙමින් සහා අරමුදල් වැයකරමින් සේවා සපයන නිසාත් සභා ලේකම්තුමිය විසින් මෙම කඩ සම්බන්ධයෙන් නඩුවක් ගොනු කර ඇති බවත් , මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේදී සභාවට අවාසිදායක ලෙස නීතියට පටහැනි තීරණයක් ගතහොත් එය වැරදි තීරණයක් වන බැවින් එකවිට තීරණයක් නොගෙන භූමියේ සැබෑ හිමිකරු කවුදැයි හඳුනා ගෙන මෙහි නෛතික තත්වයන් නිවැරදිව ග්‍රහණය කරගෙන මේ පිළිබඳව ගැඹුරින් අධ්‍යානය කර තොරතුරු රැස්කරගෙන තීරණයක් ගැනීමට කල් තැබීමටත් ගරු අධිකරණයෙන් මෙම නඩුව 2026 ජුනි මාසය දක්වා දීර්ඝ කර දිනයක් ලබා ගැනීමට කටයුතු කරමු යැයිද පැවසීය. මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාම මෙම ගොඩනැගිල්ල වෙත ගොස් ඒ පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබා ගැනීමට හා සංවර්ධන සැලසුම පිළිබඳවද අධ්‍යානය කර තොරතුරු අවබෝධ කර ගන්නා ලෙසද පවසන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

**බිබිල බස්නැවතුම්පොල දකුණුපස කඩ කාමර සම්බන්ධ 59784, 59785, 59786, 59787, 59788, 59789, 60643, 60644, 61051 බිබිල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩු 2026 ජුනි මස දක්වා දීර්ඝ කර ගැනීමටත් , මෙම කඩ කාමර සම්බන්ධයෙන් භූමියේ සැබෑ අයිතිකරු කවුරුන්දැයි හඳුනාගෙන , නෛතික තත්වය පිළිබඳ නිවැරදිව අවබෝධ කරගෙන , ප්‍රායෝගිකව කඩ කාමර පිළිබඳව අවබෝධයක් ලබා ගෙන , මේ පිළිබඳව අධ්‍යනය කර, කඩ කාමර හිමියන් සමඟ නැවත සාකච්ඡා කර , නඩුව දිගටම පවත්වාගෙන යන්නේද ව්‍යාපාරිකයින් සමග සමතයකට පත්වන්නේද යන්න පිළිබඳව සභා තීරණයක් ලබා ගැනීමට ඉදිරි සභා වාරයකට කල් තැබීමටත් තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයකගේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව සභා සම්මත විය.

ගරු මූලාසනය විසින් 2026.03.10 දින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ සියළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිය පුද කරමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි